# භික්ෂුණී විනයෙන් හෙළිවන කාන්තා චරිත සංවර්ධන සංකල්පය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

" ස්ත්‍රී භවයෙහි අනභිරත වූ සත්වයෝ පුරුෂයන් කෙරෙහි විසංයෝගයට යාමෙන් ස්ත්‍රීභාවය ඉක්මවති."

" පුරුෂ භවයෙහි අනභිරත වූ සත්වයෝ ස්ත්‍රීන් කෙරෙහි විසංයෝගයට යාමෙන් පුරුෂභාවය ඉක්මවති."

සංයොග විසංයෝග සූත්‍රය

මාරයා : ඉසිවරුන් විසින් ලැබිය යුතු වූ දුලබ වූ යම් ඒ පදවියක් වේ ද, එය දැගුල් නුවණ ඇති ස්ත්‍රිය විසින් ලැබිය නොහැක.

සෝමා තෙරණිය : සිත මැනවින් සමාධි ගත වූ කල්හි, නුවණ පවත්නා කල්හි, මනා කොට දහම් දකින්නහුට ස්ත්‍රී බව කුමක් කරන්න ද ? මම ස්ත්‍රියක්මි හෝ, පුරුෂයෙක්මි හෝ, අන් කිසිවෙක් හෝ වෙමි හෝ, යන අදහස සහිත අය සමඟ ඔය කරුණ පවසන්න.

සංයුත්ත නිකාය: සොමා සුත්ත

181646
21/02/2006
රු. 5000/-

# භික්ෂුණී විනයෙන් හෙළිවන කාන්තා චරිත සංවර්ධන සංකල්පය පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක්

එච්. ආර්. නිශාදිනී පීරිස්

කැලණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය
සඳහා ඉදිරිපත් කරනලද නිබන්ධය

2004

181646

මෙම උපාධි නිබන්ධනයෙහි ඇතුළත් සියළු කරුණු මා විසින් කරනලද පර්යේෂණයෙන් සොයාගත් ඒවා බවත්, මූලාශ්‍රයවලින් ගත් කරුණු වෙන් වශයෙන් සඳහන් කොට ඇති බවත්, මෙම නිබන්ධය වෙනත් උපාධියක් සඳහා ඉදිරිපත්කොට නොමැති බවත් මෙයින් සහතික කරමි.

..............................................

එච්. ආර්. නිශාදිනී පීරිස්

මෙම උපාධි නිබන්ධය මාගේ උපදෙස් පරිදි සිදුකරන ලද බවත්, දර්ශනපති උපාධිය පිරිනැමීම සඳහා යෝග්‍ය බවත්, මෙයින් නිර්දේශ කරමි.

..............................................

මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමි

නිබන්ධ උපදේශක

## ~ පිදුම ~

ජීවිතයෙහි මුලකුරු කියාදෙමින්

මාගේ පූර්වාචාර්යයන් වූ

මාපිය දෙදෙනාටත්,

මට මහපෙන්වීම හා ධෛර්යය

ලබාදෙමින්

මාගේ දිවිය ආලොකමත් කළ

සියළුම ගුරුවරුන්ටත්

උපහාරයක් කොට පුදමි.

# පටුන


| | | |
|---|---|---|
| පර්යේෂණයේ සංක්ෂේපය | | VI - VII |
| උපකාරානුස්මෘති | | VIII-IX |
| හැකුලුම් | | X - XI |
| 1 වන පරිච්ඡේදය | ප්‍රාග් බෞද්ධ හා බුද්ධ කාලීන භාරතීය කාන්තාව. - ඓතිහාසික පසුබිම | 1 - 15 |
| 2 වන පරිච්ඡේදය | කාන්තාව පිළිබඳ බෞද්ධ ආකල්පය | 16 - 32 |
| 3 වන පරිච්ඡේදය | භික්ෂුණී සමාජයේ ආරම්භය හා ව්‍යාප්තිය | 33 - 64 |
| 4 වන පරිච්ඡේදය | විනය, එහි අරමුණු හා ස්වභාවය | 65 - 88 |
| 5 වන පරිච්ඡේදය | විනය ශික්ෂාවලින් හෙළිවන කාන්තා චරිත සංවර්ධනයට අදාළ විධිවිධාන | 89 - 149 |
| 6 වන පරිච්ඡේදය | පෞරුෂ සංවර්ධනය හා කාන්තාව | 150 - 182 |
| | සමාලෝචනය හා නිගමනය | 183 - 184 |
| උපග්‍රන්ථය | | 185 - 196 |
| ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | | 197 - 203 |

# පර්යේෂණයේ සංක්ෂේපය.

මෙම නිබන්ධය භික්ෂුණී විනය ශික්ෂා මගින් සිදුවන චරිත සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය කිරීමේ අරමුණින් සිදුකළ පරීක්ෂණයක ප්‍රතිඵලයකි. වසර දෙදහස් පන්සියයකටත් අධික කාලයක් තිස්සේ ආරාමික සංවිධානයක් වශයෙන් ස්ත්‍රී හා පුරුෂ යන දෙපක්ෂයේම චරිත සංවර්ධනය විෂයෙහි වර්තමානය දක්වාම සුවිශේෂ දායකත්වයක් පිරිනමා ඇත්තේ බෞද්ධ විනය ශික්ෂාවන්ය.

පෞරුෂ සංවර්ධනය නූතන ලෝකයේ බහුල වශයෙන් අවධානයට ලක්වන මාතෘකාවකි. දිනෙන් දින අතිශයින් සංකීර්ණත්වයට පත්වන වර්තමාන සමාජ ක්‍රමය තුළ කළමනාකරණයෙහි වැදගත්කම ද වැඩිවෙමින් පවතී. බොහෝ දුරට ස්ථාවර ලක්ෂණ ඇති අජීව වස්තු අවශ්‍ය පරිදි සංවිධානය කිරීම තරමක් පහසු වුව ද, පුද්ගලකළමනාකරණය අතිශය දුෂ්කර කටයුත්තක් වී ඇත්තේ, එක් එක් පුද්ගලයන් අතරත මෙන් ම විවිධ පරිසරයන් හා සංස්කෘතීන්හි සංවර්ධිත චරිතයන් අතර ද, විෂමතා රාශියක් ඇති බැවිනි. මේ සඳහා අවශ්‍ය වැදගත්ම කාරණය වන්නේ පෞරුෂ ලක්ෂණ පිළිබඳ බොහෝ දුරට සාධාරණ වූ මතවාදයක් ගොඩනැගීමය. මේ සඳහා ලෝකයේ විවිධ රටවල විධිමත් පර්යේෂණ රාශියක් සිදුකර ඇති අතර, වර්තමානයේ ද සිදුවෙමින් පවතී. පෞරුෂ සංවර්ධන සංකල්පය විෂයෙහි කාන්තා චරිත සංවර්ධනයට හිමිවනුයේ ද සුවිශාල වැදගත්කමකි. ඊට හේතුව වර්තමාන සමාජයේ කාන්තාව සතු කාර්යභාරය ද අතිශය සංකීර්ණ වීමත්, එය සංවර්ධන කාර්යභාරයේ ප්‍රමුඛස්ථානයට පත්වෙමින් තිබීමත් ය. එබැවින් විනය ශික්ෂාවන්හි අන්තර්ගත සංකල්ප ඒවායෙහි ආගමික පසුබිමින් වෙන් කොට, එහෙත් ඊට සාපේක්ෂව අධ්‍යයනය කිරීමෙන්, වර්තමාන සමාජයට අදාළ වන සංකල්ප හා විධික්‍රම රාශියක් නිර්මාණය කළ හැකිය යනු අපගේ විශ්වාසයයි. විශේෂයෙන් වර්තමාන කාන්තා පරපුරේ සංවර්ධනයට දායකත්වයක් සැපයිය හැකි එබඳු සංකල්ප හා විධික්‍රම සමූහයක් භික්ෂුණී විනය ශික්ෂා හා තදනුබද්ධ සංස්කෘතික පසුබිම තුළින් මතු කොට දැක්වීම මෙම පර්යේෂණයේ අරමුණයි. මෙම අරමුණ සාක්ෂාත් කිරීම සඳහා පරිච්ඡේද හතක් යටතේ අපගේ පර්යේෂණ ප්‍රතිඵල වාර්තා ගතකර ඇත.

ප්‍රාග් බෞද්ධ යුගයෙහි භාරතීය සමාජ ආකල්ප ඔස්සේ ගොඩනැගුණු කාන්තා චරිත ලක්ෂණ අධ්‍යයනයට ලක්නොකර කාන්තාව පිළිබඳ බෞද්ධ ආකල්පය හඳුනාගැනීම අපහසුය. එම නිසා ප්‍රාග් බෞද්ධ යුගයෙහි භාරතීය කාන්තාව පිළිබඳ අධ්‍යයනයට පළමු පරිච්ඡේදයත් සමාජය විෂයෙහි කාන්තාව සතු කාර්යභාරය හා ඇයට හිමි ස්ථානය පිළිබඳ බෞද්ධ ආකල්පය හඳුනාගැනීමට දෙවන පරිච්ඡේදයත් වෙන්කර ඇත. භික්ෂුණී සමාජයෙහි

ආරම්භය කාන්තාව පිළිබඳ බෞද්ධ ආකල්පය ක්‍රියාවට නැංවීමක් ලෙස හැඳින්විය හැක. බුද්ධකාලීනව හා ඉන් අනතුරුව භික්ෂුණී සමාජය ලැබූ ව්‍යාප්තිය ප්‍රකට කරන්නේ, කාන්තාව පිළිබඳ වඩාත් නිදහස් හා විවෘත ආකල්පයක් ක්‍රියාවට නැංවීම, එවන විට පැවති ප්‍රධාන සමාජ අවශ්‍යතාවක්ව පැවති බවයි. බුදුසසුන තුළ කාන්තා පැවිද්ද අනුදැනීම අරබයා සූත්‍ර විනය පිටක හා අටුවාවල ගොණුව ඇති කරුණු සංසන්දනාත්මකව අධ්‍යයනය කිරීමටත්, භික්ෂුණී සමාජය බුද්ධකාලීනව අත්කරගත් ව්‍යාප්තිය විමසා බැලීමටත්, තෙවන පරිච්ඡේදය වෙන්කර ඇත්තේ එහෙයිනි. මූලික වශයෙන් තෙවන පරිච්ඡේදයටත්, හතරවන හා පස්වන පරිච්ඡේදවලටත් ආධාරකයක් ලෙස තෙවන පරිච්ඡේදයට උපග්‍රන්ථයක් එක්කර ඇත.

ප්‍රථමාභිසම්බෝධියේදී සංඝ සමාජය සංවරවූයේ විනය ශික්ෂාවල ආධාරයකින් තොරවය. බුදුරදුනට අනුව එම යුගයේදී විමුක්තිලාභීහුද බහුල වූහ. එසේනම් විනය ශික්ෂා පැණවීමේ අවශ්‍යතාව පැණනැගුනේ මන්ද? විනය මගින් සංඝයාගේ සංවරය විෂයෙහි දක්වන දායකත්වය කුමක්ද? සිව්වන පරිච්ඡේදය මේ පිළිබඳ විචාරාත්මක අධ්‍යයනයක යෙදීමට යොදාගෙන ඇත. පස්වන පරිච්ඡේදය විනය ශික්ෂා මගින් අපේක්ෂිත වූ චරිත සංවර්ධනය කෙබදු ආකාරයක් ගනීද යන්න භික්ෂුණී ප්‍රාතිමොක්ෂය හා භික්ෂුණීනට පමණක් අදාල සෙසු විනය ශික්ෂා ඇසුරින්, අධ්‍යයනය කිරීමෙහි ප්‍රතිඵලයකි. එහිදී විනය ශික්ෂා මගින් අපේක්ෂිත අරමුණු අනුව ඒවා වර්ගීකරණයකට ලක්කර ඇත.

බුදුසමය දක්වන පෞරුෂ සංවර්ධනය කෙබඳුද? එය නූතන සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක මත හා සැසැඳිය හැකිද? බුදුසමය දක්වන පෞරුෂ සංවර්ධනය කාන්තාව විෂයෙහි කළ බලපෑම කෙබඳු ද? යන්න අධ්‍යයනයට බඳුන් කිරීම හයවන පරිච්ඡේදයේ අරමුණයි. ඉහත පරිච්ඡේද ඔස්සේ සාකච්ඡාවට බඳුන් වූ කරුණු අනුව එළඹිය හැකි නිගමනය හත්වන පරිච්ඡේදයේ දැක්වේ.

# උපකාරානුස්මෘති

මාගේ අධ්‍යයන කටයුතුවලදී මට නොමද පිටුවහලක් දෙමින් මා දිරිමත් කළ මාගේ දෙමාපියන්ව මෙහිදී මා ගෞරවාදරයෙන් සිහිපත් කරමි.

මුළුමනින්ම ආගන්තුක වූ බෞද්ධ සංස්කෘතිය විෂය ක්ෂේත්‍රයයේ මුලකුරු කියා දෙමින් ඉතා ඉවසීමෙන් මෙපමණ දුරක් ඒමට මංපෙත් එලිකර දුන් මාගේ නිබන්ධක උපදේශකයාණන්ද වූ මහාචාර්ය දේවාලේගම මේධානන්ද හිමිපාණන්ව ඉතාමත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි. බොදුනු ඇදුරකුගේ ලක්ෂණ පිළිබඳ විෂය කරුණු වශයෙන් පමණක් නොව සිය චර්යාවෙන්ම පරමාදර්ශී වූ උන්වහන්සේගේ සහය නොවන්නට මේ ක්ෂේත්‍රය තුළ මෙපමණ දුරක් ඒමට මට නොහැකි වන බව මා පවසන්නේද ඉමහත් භක්තියෙනි.

මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා යටතේ අධ්‍යාපනය ලැබීමට ලත් අවස්ථාවද මා සළකන්නේ දුර්ලභගණයේ භාග්‍යයක් ලෙසය. එතුමන්. මා හට ලබාදුන් මඟපෙන්වීම හා දිරිමත්කිරීම සිහිපත් කළේ විනය සූත්‍ර පිටක තුළ හමුවන පරමාදර්ශී බෞද්ධ ආචාර්යවරයකුගේ ලක්ෂණයන්ය. එතුමන්ගෙන් මා ලද මඟපෙන්වීම හා දිරිමත් කිරීම බාධක ඉදිරියේ නොසැලී, මෙම ක්ෂේත්‍රය තුළ ඉදිරියට යාමට මට දිරියක් වූ බව ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි.

දර්ශනපති යෝග්‍යතා විභාගයට මා සූදානම්කිරීමේදී විශේෂ කැපවීමකින් ක්‍රියාකළ මහාචාර්ය කුඹුරුගමුවේ වජිර හිමිපාණන්ද මම මෙහිදී ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි. බුදුසමය ඉදිරිපත් කරන මැදුම් පිළිවෙත ප්‍රායෝගිකව යොදාගන්නා ආකාරය න්‍යායක් ලෙස නොව සිය ඉගැන්වීම් විලාසය තුළින්ම ඉදිරිපත් කරමින් මට ලබාදුන් පුහුණුව මෙම පරීක්ෂණයේදී මහගු උපකාරයක් වූ බව විශේෂයෙන්ම සඳහන් කළයුතුය.

මෙම අධ්‍යයනයට අවශ්‍ය ත්‍රිපිටක පොත් සපයා දෙමින් සහය වූ ගම්පහ ප්‍රේමසිරි හිමිපාණන්වද මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. මෙහිදී මා

නම් වශයෙන් සඳහන් නොකළද දැන හෝ නොදැන මෙම නිබන්ධය සැකසීමට මාහට උපකාර වූ සැමදෙනාටද මෙහිදී මාගේ ස්තුතිය පිරී නැමීමට කැමැත්තෙමි.

එච්. ආර්. නිශාදිනී පීරිස්

# හැකුලුම්

* පාරා. පාලි. : පාරාජිකාපාලි - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 1 - ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය– 1959
* පාචි. පාලි : පාචිත්තියපාලි 1,11 - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 2(1,2) ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය 1981 - 1995
* මව. පාලි : මහාවග්ග පාලි 1,11 - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 3, 4 - ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය - 1959
* චු.ව. පාලි : චුල්ලවග්ග පාලි 1,11 - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 5(1,11) ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය- 1977 - 1983
* දී.නි. : දීඝ නිකාය 1,11,111 - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 7,8,9 - ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය - 1960 - 1982
* ම.නි. : මජ්ඣිම නිකාය 1,11,111 - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 10 ,11,12 ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය – 1964 - 1974
* ස. නි. : සංයුක්ත නිකාය 1,11 ,111 ,VI, V - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 13,14,15,16,17 - ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය - 1960 - 1982
* අ.නි. : අංගුත්තර නිකාය 1,11,111, VI, V,VI- බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 18,19,20,21,22,23 - ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය - 1960 - 1977
* සු. නි. : සුත්ත නිපාතය -බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 25 - ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය - 1977
* ථෙර / ථෙරී ගාථා : ථෙර ථෙරී ගාථා පාලි - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 28, 29 ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය - 1972
* අප. පාලි : අපදාන පාලි 11 - බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (37:2) ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය - 1983
* මනුස්මෘතිය : මනුස්මෘතිය - පරිවර්තනය - පියදස නිශ්ශංක - 1991

* සාග්වේදය : සාග්වේද ගීතාවලි - ආතර් ඇන්තනී මැක්ඩොනල් - පරිවර්තනය- නාරාවිල පැට්‍රික් - 1997
* සි.බු.නි. : සිංහල බුද්දක නිකාය - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය - 1998
* සි.දි.නි. : සිංහල දීඝ නිකාය - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය - 1998
* ස.පා. : SAMANTAPASADIK'A or VINAYATTHAKATHA PART III - Bhadantacariya Buddhugosa Maha Thero –,VI– Revised & Edited by Ven. Welivitiye Premaratana Thero -Published by Wimala Dhamma Hewavitarane ESQ.& Sirinatha Kumaradasa MoonesingheMaligakanda Colombo 1946
* පර.දී' : PARAMATTHA DIPANI or THE COMMENTARY OF THE THERI – GATHA OF THE KUDDAKA IKAYA SUTTA PITAKA – Bihalopala Siri Dewarakkhita Thera – the Tripitaka Publication Press , Sarasawi Hall, Pettah – Colombo - 1918

# 1. ප්‍රාග්බෞද්ධ හා බුද්ධකාලීන භාරතීය කාන්තාව.

බුද්ධකාලීන භාරතීය සමාජය වූ කලී අතිශය සංකීර්ණ වූවකි. එබැවින් ඒ පිළිබඳව යම් අවබෝධයක් ලබාගැනීමට, එම සංකීර්ණ ස්වභාවයට හේතු වූ බුද්ධකාලයෙන් සහස්වස් දෙකක් පමණ ඈතට දිවයන ඓතිහාසික පසුබිමද විමසාබැලීමට සිදුවේ. එනම් බුද්ධකාලීන සමාජයට, ආර්ය සංස්කෘතිය හා, ආර්යාගමනයට පෙර පැවති මොහෙන්ජොදාරෝ හරප්පා වැනි අනාර්යයන් විසින් ගොඩනැගූ සංස්කෘතිය, විසින් කළ බලපෑම, හඳුනාගැනීම වැදගත් වේ. ආර්යාගමනය වනවිට භාරතයෙහි දස්‍යුන් ලෙසින් හැඳින්වූ අනාර්යයන් විසින් ගොඩනැගූ උසස් සභ්‍ය සංස්කෘතියක් පැවතිණි. සටන්කාමීන් වූ ආර්යයෝ මෙම අනාර්ය දස්‍යුන් යටපත් කරගෙන සමාජපාලනය සියතට ගත්හ. ආර්යාගමනයෙන් සහස්වස් දෙකක පමණ කාලයක් ගතවන විට, භාරතීය සමාජය වෙත ප්‍රබල බලපෑමක් කරන කණ්ඩායම ලෙස හඳුනාගත හැක්කේ ආර්ය පූජකයන් වූ බ්‍රාහ්මණයන්ය. බුද්ධකාලය වනවිට භාරතයේ බලපැවැත්වූ සමාජ සංකල්ප මෙම බ්‍රාහ්මණික ආගමික සංකල්ප අනුසාරයෙන් සකස්ව පැවතියේ, මෙහි ප්‍රතිඵලයක් ලෙසිනි. ආර්යයන් භාරත දේශයෙහි ජනාවාස කළ මුල් අවධියේ පටන් ආර්ය පූජකයන් වූ බ්‍රාහ්මණයන්, ක්‍රමක්‍රමයෙන් ආගමික විශ්වාස උපයෝගී කරගනිමින් දේශපාලනික, ආර්ථික, අධ්‍යාපනික, සංස්ථා හැසිරවීමට පෙළඹෙන ආකාරය වෛදික සාහිත්‍යයෙන් හඳුනාගත හැකිය. දෙවිවරුන් පිළිබඳ පෞරාණික පසුතලයෙන් උරුම වූ විශ්වාසයන් තවදුරටත් ඉදිරියට ගෙනයාමේදී, දෙවිවරුන් තෘප්තිමත්කිරීම සඳහා විවිධ යාගහෝම ක්‍රම සකස් කළ බ්‍රාහ්මණයෝ, ඒ පිළිබඳ පූජකත්වය ලබාගත්හ. මෙම යාගහෝම මඟින් දේශපාලනිකව, ආර්ථිකව, සමෘද්ධිය ලබාගත හැකිබව ප්‍රකටකිරීම නිසා, එම ක්ෂේත්‍ර විෂයෙහි යම් බලපෑමක් කිරීමට ඔවුනට හැකි විය. මෙම යාගහෝම කළහැකි එකම කොට්ඨාශය ලෙස තමන් හඳුන්වාදීම නිසා, පූජකත්වය ඔවුනට හිමි විශේෂ වරප්‍රසාදයක් බවට පත්කර ගත්හ. අධ්‍යාපනික වශයෙන්ද වඩාම වැදගත් කොට සැලකූයේ මන්ත්‍ර අධ්‍යයනයයි. එමනිසා අධ්‍යාපනික ක්ෂේත්‍රයේ ද අධිකාරිත්වය ඔවුන් සතුවිය. සමාජය විෂයෙහි වැදගත් වූ අනෙකුත් දැනීම් සියල්ල ද, ඔවුන් වෙතින්ම ලැබීමට සමාජය හුරු වූ හෙයින්, බ්‍රාහ්මණයා ක්‍රමයෙන් භාරතීය සමාජයේ ප්‍රමුඛත්වයට පැමිණියේය.

මෙම තත්වය ස්ථාවර කරගැනීමටත්, තම අධිකාරිත්වය සමාජයේ සෙසු කොටස්වලට හිමි නොකිරීමටත්, ක්‍රමයක් මොවුහු සකස්කළහ. එනම් උපත මඟින් තීරණය වන වර්ණ ධර්මයක් ද,

ඒ මත ජීවිතය ගතකළයුතු ස්වධර්මයක් ද, සමාජයට හඳුන්වාදීමය. ඍග්වේදයට අනුව මෙම වර්ණ ධර්මයේ ප්‍රභවය විශ්වයේ නිර්මාණය සමඟ සිදුවූවකි.

" මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් බමුණෝ ද, බාහුවලින් ක්ෂත්‍රියෝ ද, කලවයෙන් වෛශ්‍යයෝ ද, පතුලෙන් ශුද්‍රයෝ ද, උපන්නාහ. "[1]

මෙලෙස ප්‍රභවය වූ වර්ණයනට උපතින්ම පැවරුණු කාර්යයන් ද වෙන් වෙන්ව පැවතිණි. මනුස්මෘතියට අනුව

* බ්‍රාහ්මණයනට - වේද අධ්‍යයනය, අධ්‍යාපනය, යාගකිරීම හා කරවීම ද, පරිත්‍යාග කිරීම හා පරිත්‍යාග භාරගැනීම ද,
* ක්ෂත්‍රියනට - ප්‍රජා පාලනය, දන්දීම, යාගකිරීම, වේද අධ්‍යාපනය, කම් සැපතෙහි නොඇලී ක්‍රියාකිරීම ද,
* වෛශ්‍යයනට - ගවාදී පාලනය, දන්දීම, යාගකිරීම, වේද අධ්‍යාපනය, වෙළදාම, පොළීකිරීම, ගොවිතැන් කිරීම ද,
* ශුද්‍රයනට - ඉහත දැක්වූ ත්‍රිවිධ වර්ණයනට ඊර්ෂ්‍යා නොකර මෙහෙකිරීමද

පැවරී තිබිණි.[2] මෙම නියමයන් උල්ලංඝනය කිරීම බරපතල වරදක් ලෙස අවධාරණය කළ අතර, වර්ණ සංකරවීම වැලැක්වීම රජුගේ යුතුකමක් ලෙස ඉගැන්විණ.

ආර්යාගමනය වනවිට භාරතීය සමාජයේ පැවති දියුණු ශිෂ්ටාචාරයෙහි ප්‍රමුඛත්වය ගෙන සිටියෝ දස්‍යුහුය. කාන්තාව ගෞරවාදරයට හා පූජනීයත්වයට පත්ව සිටි මෙම සමාජය, මාතෘ මූලික විය. දස්‍යු සමාජය යටපත් කරමින් තමන් වෙත බලය ස්වකේන්ද්‍ර කරගනිමින්, සමාජය සැකසීමට බ්‍රාහ්මණයන් ගත් උත්සහායෙහි ප්‍රතිඵලය වූයේ දස්‍යුන් හා කාන්තාව, සමාජයේ සියලු අයිතිවාසිකම් අහිමි කොටස් බවට පත්වීමයි. මෙලෙස දස්‍යුන් සමාජයෙහි පහත්ම කොටස හෙවත් ශුද්‍රයන් බවට පත්කිරීමටත්, අනාර්ය යුගයෙහිදී පූජනීයත්වයට පත්ව සිටි කාන්තාව පහත් ගති පැවතුම් ඇති, කිසිදු ගෞරවයක් අහිමි තැනැත්තියක බවට පත්කිරීමටත් ඔවුහු සමත් වූහ. එනම් අනාර්ය යුගයේදී ආර්ථික, ආගමික, අධිකරණමය, දේශපාලනික, යනාදී අංශ විෂයෙහි ප්‍රමුඛත්වයෙහි සිටි මොවුන් යටපත් කිරීමට යොදාගත් වෛදික බ්‍රාහ්මණික ඉගැන්වීම්වල ප්‍රතිඵලයක් ලෙස, ඉහත සියලු අයිතිවාසිකම් අහිමිය යන ආකල්පය සමාජයට කාවැදීම සිදුවිය.